A/L පන්තිය
www.alpanthiya.lk



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| පාලි I<br>பாளி I<br>Pali I | 74 S-T-E I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** **තම යහපත** යන අදහස දෙන පාලි වචනය කුමක් ද?
(1) අත්ථදත්ථං (2) අත්ථදත්තං (3) අත්ථධත්තං
(4) අත්තදත්ථං (5) අත්තදත්තං

**2.** **මුඩා** යන්නෙහි අර්ථය වන්නේ,
(1) මුදුනෙහි යන්න ය. (2) ඔටුන්නෙහි යන්න ය. (3) හිසෙහි යන්න ය.
(4) මුදලට යන්න ය. (5) නොමිලේ යන්න ය.

**3.** රහතන් වහන්සේලා හැඳින්වීමට යෙදෙන පර්යාය නාමයක් වන්නේ කුමක් ද?
(1) පසත්ථා (2) දක්ඛිණෙය්‍යා (3) ඵුස්සිතග්ගෙ
(4) ඛීණබීජා (5) වරාහරො

**4.** **මණ්ඩුක කච්ඡපා** යනු,
(1) දෙව්වරු දෙදෙනෙකුගේ නම් ය. (2) වළලු සහ රෙදි වෙළෙන්දෝ ය.
(3) මැඩියෝ සහ කැස්බෑවෝ ය. (4) මත්ස්‍යයෝ සහ කිඹුල්ලු ය.
(5) සොරු සහ අලුගෝසුවෝ ය.

**5.** "දුකට බිය නම් දුක අප්‍රිය නම් තාදී ගුණැති බුදුන් ද ධර්මය ද සංඝයා ද සරණ යන්න. සිල් සමාදන් වන්න."
මෙම ප්‍රකාශය,
(1) දේවධර්ම ජාතකයේ බෝසතුන් විසින් යක්ෂයාට කියන ලද්දකි.
(2) ධම්මික සූත්‍රයෙහි බුදුරදුන් විසින් ධම්මික උපාසක ඇතුළු පිරිසට දෙසන ලද්දකි.
(3) මහාවංසයෙහි සඳහන් දුටුගැමුණු රජු විසින් ථේරපුත්තාභය යෝධයාට කියන ලද්දකි.
(4) ථේරී ගාථාවෙහි සඳහන් පුණ්ණා දාසිය විසින් බ්‍රාහ්මණයාට කියන ලද්දකි.
(5) වණ්ණුපථ ජාතකයෙහි බෝසතුන් විසින් සෙසු ගැල්කරුවන්ට කියන ලද්දකි.

**6.** වඩාත් පූර්වතර වංසකථාව කුමක් ද?
(1) දීපවංසය (2) මහාවංසය (3) බුද්ධවංසය
(4) ලලාටධාතුවංසය (5) මහාබෝධිවංසය

**7.** **අසමාන** ග්‍රන්ථයක් දැක්වෙන වරණය තෝරන්න.
(1) දීඝනිකාය, මජ්ඣිමනිකාය, ඛුද්දකනිකාය
(2) සංයුත්තනිකාය, අංගුත්තරනිකාය, ඛුද්දකනිකාය
(3) පාරාජිකාපාළි, පාචිත්තියපාළි, චුල්ලවග්ගපාළි
(4) දාඨාවංස, කෙසධාතුවංස, ථූපවංස
(5) ධම්මසංගණිප්පකරණ, කථාවත්ථුප්පකරණ, මිළින්දපඤ්හ

A/L සත්තිය
www.alpanthiya.lk

8. ප්‍රථම සංගායනාවේ දී විනය පිටකය සංඝයා මැද ප්‍රකාශ කරන ලද්දේ කවුරුන් විසින් ද?
   (1) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ  (2) ආනන්ද මහරහතන් වහන්සේ
   (3) උපාලි මහරහතන් වහන්සේ  (4) සබ්බකාමී මහරහතන් වහන්සේ
   (5) මොග්ලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ

9. **සාමඤ්ඤඵල** සහ **උපාලි** යන සූත්‍ර යුග්මය ඇතුළත් වන්නේ පිළිවෙළින්
   (1) දීඝනිකායේ සහ මජ්ඣිමනිකායේ ය.
   (2) මජ්ඣිමනිකායේ සහ සංයුත්තනිකායේ ය.
   (3) සංයුත්තනිකායේ සහ අංගුත්තරනිකායේ ය.
   (4) අංගුත්තරනිකායේ සහ ඛුද්දකනිකායේ ය.
   (5) ඛුද්දකනිකායේ සහ මහාවග්ගපාළියේ ය.

10. ඛුද්දක නිකායට අයත් **නො වන** ග්‍රන්ථයක් සහිත වරණය තෝරන්න.
   (1) ඛුද්දකපාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක  (2) සුත්තනිපාත, ථෙරගාථා, විමානවත්ථු, පෙතවත්ථු
   (3) ථෙරීගාථා, ජාතක, නිද්දෙස, පාතිමොක්ඛ (4) පටිසම්භිදාමග්ග, අපදාන, බුද්ධවංස, චරියාපිටක
   (5) ථෙරීගාථා, ජාතක, උදාන, පටිසම්භිදාමග්ග

11. **අසන්ධිමිත්‍රා** දේවිය යනු
   (1) සංඝමිත්තා රහත් මෙහෙණියට භාවිත වූ අපර නාමයකි.
   (2) මිහිඳු මහරහතන් වහන්සේගේ සොහොයුරියකි.
   (3) දේවානම්පියතිස්ස රජුගේ මෙහෙසිය ය.
   (4) ධර්මාශෝක රජුගේ මෙහෙසියකි.
   (5) බුදුරදුන්ට අපහාස කිරීමට තැත් කළ කාන්තාවකි.

12. **ඥාතපුත්‍ර මහාවීර** යනුවෙන් හැඳින්වෙන්නේ
   (1) නිගණ්ඨනාථපුත්‍ර ය.  (2) සංජය බෙල්ලට්ඨිපුත්‍ර ය.
   (3) අඤ්ඤා කොණ්ඩඤ්ඤ තෙරුන් ය.  (4) ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හිමියන් ය.
   (5) බුදුන් වහන්සේ ය.

13. ඡබ්බග්ගිය භික්ෂූන්ට අයත් **නො වන** භික්ෂූන්ගේ නම් සඳහන් වරණය තෝරන්න.
   (1) පණ්ඩුක, ලොහිතක  (2) සාති, දේවදත්ත
   (3) මෙත්තිය, භුම්මජක  (4) අස්සජි, පුනබ්බසුක
   (5) ලොහිතක, භුම්මජක

14. මජ්ඣිම නිකායේ ඇතුළත් සූත්‍ර සංඛ්‍යාව
   (1) 34 කි.  (2) 150 කි.  (3) 152 කි.  (4) 7762 කි.  (5) 9557 කි.

15. තෙවන සංගීතියට පෙර ලියන ලද අටුවා ලක්ෂණ සහිත ග්‍රන්ථ වන්නේ
   (1) මහාට්ඨකථා හා සංඛෙපට්ඨකථා
   (2) මහාපච්චරියට්ඨකථා හා කුරුන්දි අට්ඨකථා
   (3) විසුද්ධිමග්ග හා සමන්තපාසාදිකා
   (4) පෙටකොපදෙස හා නෙත්තිප්පකරණ
   (5) චුල්ලනිද්දෙස හා මහානිද්දෙස

16. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ විසින් සම්පාදිත කෘතියක් වන්නේ
   (1) අත්ථසාලිනියයි.  (2) කථාවත්ථුප්පකරණයයි.
   (3) ඛුද්දකපාඨයයි.  (4) ධම්මසංගණිප්පකරණයයි.
   (5) විමානවත්ථුවයි.

17. මේවායින් උපමාවක් සහිත යෙදුම කුමක් ද?
   (1) නිබ්බන්ති ධීරා යථායං පදීපො  (2) චතුබ්භි වාතෙහි අසම්පකම්පියො
   (3) ගිම්හානමාසෙ පඨමස්මිං ගිම්හෙ  (4) යෙ සුප්පයුත්තා මනසා දළ්හෙන
   (5) වරො වරඤ්ඤූ වරදො වරාහරො

www.alpanthiya.lk

**18.** බෞද්ධ භික්ෂුත්වය වඩාත් මැනවින් පිළිබිඹු වන ප්‍රකාශය මෙවායින් කවරක් ද?
(1) මාලං න ධාරෙ න ච ගන්ධමාචරෙ
(2) රත්තිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං
(3) න වෙ විකාලෙ විචරෙය්‍ය භික්ඛු
(4) සබ්බසංඝො ච තං ලභි
(5) භික්ඛු යථා පොක්ඛරෙ වාරිබින්දු

**19.** ගිහි ජීවිතයට වඩාත් අදාළ වන උපදේශය තෝරන්න.
(1) කාලෙන සො පවිසෙ පාතරාසං
(2) එකො පටික්කම්ම රහො නිසීදෙ
(3) පයොජයෙ ධම්මිකං සො වණිජ්ජං
(4) කරොන්ති වඤ්ඤෙපි ජනෙ පමත්තෙ
(5) සීතං වෙදයසෙ භුසං

**20.** "දැහැමි ව මව්පියන් පෝෂණය කරන, දැහැමින් වෙළඳාම කරන අප්‍රමාදී ගිහියන් දෙව්ලොව ස්වයංප්‍රභා නම් දෙවියන් කරා පැමිණේ." මෙම ප්‍රකාශය ඇතුළත් වන්නේ,
(1) ධම්මික සූත්‍රයේ ය.
(2) භූතත්ථෙරගාථාවෙහි ය.
(3) සේරිවාණිජ ජාතකයෙහි ය.
(4) මහාවංසයෙහි ය.
(5) වණ්ණුපථ ජාතකයෙහි ය.

- පහත දැක්වෙන පාඨය කියවා **21** සිට **25** දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තෙ තං සාසනං සුත්වා සංසාරෙ සංසරන්තානං න පුත්තො න ධීතා නාම නත්ථි. තෙ අම්හාකං මහාපරාධිකා. න සක්කා තෙහි අම්හාකං චක්ඛුපථෙ ඨාතුං. එත්තකං පන නාම ධනං ගහෙත්වා ද්වෙපි ජනා ඵාසුකට්ඨානං ගන්ත්වා ජීවන්තු. දාරකෙ පන ඉධ පෙසෙන්තූති. සෙට්ඨිධීතා මාතාපිතූහි පෙසිතං ධනං ගහෙත්වා දාරකෙ ආගතදූතානංයෙව හත්ථෙ දත්වා පෙසෙසි. දාරකා අය්‍යකකුලෙ වඩ්ඪන්ති.

**21.** ඉහත පාඨය ඇතුළත් වන ජාතක කථාව කුමක් ද?
(1) සේරිවාණිජ ජාතකය
(2) තණ්ඩුලනාළි ජාතකය
(3) වණ්ණුපථ ජාතකය
(4) චුල්ලසෙට්ඨි ජාතකය
(5) දෙවධම්ම ජාතකය

**22.** '**න සක්කා තෙහි අම්හාකං චක්ඛුපථෙ ඨාතුං**' යන්නෙන් කියැවෙන්නේ පහත දැක්වෙන කවර අදහස ද?
(1) මෙය ඔවුන් විසින් අපට පෙනෙන්නට තැබූවක් නො වේ.
(2) උන් අපේ ඇහැට පෙනෙන මානයේ ඉන්ට ඕනැ නෑ.
(3) අපේ ඇස් හමුවේ කිසිවක් තියෙන්ට ඕනැ නෑ.
(4) ඔවුන් අපට පෙනෙන්න සිටියේ නැහැ.
(5) ඔවුහු අපගේ ඇස් සුව කරන්නට හැක්කෝ වෙති.

**23.** '**ජීවන්තු**' යන්නෙහි ආඛ්‍යාත විභක්තිය පහත දැක්වෙන ඒවායින් කුමක් ද?
(1) වත්තමානා
(2) සත්තමී
(3) පඤ්චමී
(4) භවිස්සන්ති
(5) කාලාතිපත්ති

**24.** ඉහත පාඨයේ '**භාර දී යැවී ය**' යන අදහස කියැවෙන පාලි යෙදුම කුමක් ද?
(1) ද්වෙපි ජනා ඵාසුකට්ඨානං ගන්ත්වා…
(2) පෙසිතං ධනං ගහෙත්වා
(3) දාරකෙ පන ඉධ පෙසෙන්තු
(4) හත්ථෙ දත්වා පෙසෙසි
(5) දාරකා අය්‍යකකුලෙ වඩ්ඪන්ති

**25.** ඉහත පාඨය අනුව සිටු දියණිය කළ ක්‍රියාවක් ඇතුළත් වරණය කුමක් ද?
(1) සංසාරයේ ස්වභාවය කියා මව්පියන්ට හසුනක් යැව්වා ය.
(2) දරුවන් පෝෂණය කිරීමට අපහසු බව කියා දෙමව්පියන්ගෙන් මුදල් ඉල්ලුවා ය.
(3) මව්පියන් බැලීමට දරුවන් සමඟ සිටු ගෙදරට ගියා ය.
(4) මව්පියන් දුන් මුදල් ප්‍රමාණවත් නො වන බව දැන්වූවා ය.
(5) මව්පියන් විසින් එවන ලද ධනය ගත්තා ය.

**26.** ඛන්ධක ගණයට වැටෙන කෘතිය තෝරන්න.
(1) මහාවංසය
(2) මිළින්දපඤ්හය
(3) පාරාජිකාපාළි
(4) මහාවග්ගපාළි
(5) ධම්මසංගණිප්පකරණය

**27.** සෝවාන් වීමත් සමග විය හැක්කේ මෙවායින් කවරක් ද?
(1) සියලු කෙලෙස් ප්‍රහාණය වීම
(2) සෑම දෙයක් ම දන්නෙකු වීම
(3) සතර අපායේ නො වැටීම
(4) නැවත මිනිස් ලොව නූපදීම
(5) උඩඟුකම නැතිවීම

A/L පන්තිය
www.alpanthiya.lk

**28.** ධාර්මික ගිහි ජීවිතය සම්බන්ධයෙන් අනුශාසනාවක් කිරීමට වඩාත් ම සුදුසු මූලාශ්‍රයක් වන්නේ පහත දැක්වෙන ඒවායින් කවරක් ද?
(1) පුණ්ණා ථෙරීගාථා (2) ධම්මික සූත්‍රය (3) රතන සූත්‍රය
(4) භූතත්ථෙරගාථාව (5) ඛුද්දකපාඨය

**29.** මාංශ පරිභෝජනය පිළිබඳ සඳහන් වන්නේ,
(1) වම්මික සූත්‍රයේ ය. (2) උපාලි සූත්‍රයේ ය. (3) සිගාලෝවාද සූත්‍රයේ ය.
(4) ජීවක සූත්‍රයේ ය. (5) අග්ගඤ්ඤ සූත්‍රයේ ය.

**30.** '**නිබ්බන්ති ධීරා යථායං පදීපො**' යන පාඨය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශයක් වන්නේ කුමක් ද?
(1) උපමාවකින් යුක්ත ය. (2) අනුප්‍රාසයක් සහිත ය.
(3) ප්‍රහේලිකාවක් කියැවේ. (4) ස්වභාවෝක්තියකි.
(5) රූපකයකින් යුක්ත ය.

**31.** '**සුස්සුසමානා**' යන්නෙහි තේරුම මේවායින් කුමක් ද?
(1) සූ සූ යැයි ශබ්ද කරන්නාහු (2) උගත්කම පිළිබඳ මානය ඇත්තාහු
(3) නැන්දම්මා යන හැඟීම ඇත්තාහු (4) කුඩා දරුවෙකුට සමාන වූවාහු
(5) අසනු කැමැත්තාහු

**32.** '**ඝාතයෙය්‍ය**' යන පදය ව්‍යාකරණානුකූලව
(1) සන්ධි පදයකි. (2) පූර්ව ක්‍රියාවකි. (3) තුමන්ත ක්‍රියාවකි.
(4) ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි. (5) කිතකයකි.

**33.** '**කෙචි**' යන්නෙහි ඒකවචන රූපය කුමක් ද?
(1) කඤ්චි (2) කිඤ්චි (3) කොචි (4) කාචි (5) කෙ

**34.** '**අත්තදත්ථමභිඤ්ඤාය**' යන්නෙහි නිවැරදි විසන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.
(1) අත්තං අත්ථං අභිඤ්ඤාය (2) අත්ත දත්ථං අභිඤ්ඤාය
(3) අත්තදං ථං අභිඤ්ඤාය (4) න තදත්ථං අභිඤ්ඤාය
(5) අත්තත්ථං අභිඤ්ඤාය

**35.** '**භූතත්ථෙරගාථාව**' සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශයක් වන්නේ මේවායින් කවරක් ද?
(1) ථෙරගාථාවෙහි නවක නිපාතයට අයත් ය.
(2) මෙහි ගාථා භූත නම් රහතන් වහන්සේ නමක් විසින් ප්‍රකාශිත ය.
(3) මෙහි ඇතුළත් ගාථා සංඛ්‍යාව නවයකි.
(4) අජකරණී නදිය ගැන මෙහි සඳහන් වේ.
(5) මෙහි ගාථාවලින් පඤ්චස්කන්ධයෙහි අනියත බව ප්‍රකාශ වේ.

**36.** '**ආකාස**' යන්නට පර්යාය වචනයක් **නො වන්නේ** කුමක් ද?
(1) ගගනෙ (2) නගෙ (3) නභෙ (4) විහඟපථෙ (5) අන්තලික්ඛෙ

**37.** '**කිව්සුම**' යන අරුත් දෙන පදය මෙයින් කුමක් ද?
(1) බ්‍රහ්මස්සරො (2) උක්කාසිතසද්දො (3) මහාසද්දො
(4) ඛිපිතසද්දො (5) ගජ්ජිතං

**38.** '**සම්මුතිදෙව**' යනු
(1) රාජකුමාරාදීහු ය. (2) දෙව්ලොව දෙවියෝ ය.
(3) රහතන් වහන්සේලා ය. (4) වෘක්ෂ දේවතාවෝ ය.
(5) බ්‍රහ්මයෝ ය.

**39.** '**අයං ගව්ජතු වා මා වා මයා ගන්තුං වට්ටති**' මෙය කවරෙකුගේ සිතිවිල්ලක් ද?
(1) වණ්ණුපථ ජාතකයේ ගැල් නායකයාගේ ය.
(2) සේරිවාණිජ ජාතකයේ අඳ බාල වෙළෙන්දාගේ ය.
(3) දේවධම්ම ජාතකයේ සූරිය කුමාරයාගේ ය.
(4) චුල්ලසෙට්ඨි ජාතකයේ සිටු දියණියගේ ය.
(5) පුණ්ණා ථෙරීගාථාවේ සඳහන් බමුණාගේ ය.

**40.** '**මංසලොහිතඛාදකො**' යන්න
(1) සර්ව නාමයකි. (2) සමාසයකි. (3) තද්ධිතයකි.
(4) කිතකයකි. (5) සන්ධියකි.

A/L පන්තිය
www.alpanthiya.lk

**41.** '**බ්‍රහ්මබන්ධු පුරෙ ආසිං**' යන මෙයින් අදහස් වන්නේ, පෙර මම
(1) 'බ්‍රහ්මයෙක් වීමි' යන්න ය.
(2) 'බමුණෙක් වීමි' යන්න ය.
(3) 'බ්‍රහ්මබන්ධු නම් පුරයෙහි ජීවත් වීමි' යන්න ය.
(4) 'බ්‍රහ්මචාරී වීමි' යන්න ය.
(5) 'බ්‍රාහ්මණයන්ගේ නෑදෑයෙක් වීමි' යන්න ය.

**42.** '**යො සාසනං අරහතං ...**' යනාදී ගාථාවෙහි අවසාන පාදය කුමක් ද?
(1) තං වෙ පරමදුක්කරං
(2) නාථං ලභති දුල්ලභං
(3) වජිරං වස්මමයං මණිං
(4) සද්ධප්පසුතො සියා
(5) අත්තඝඤ්ඤාය ඵල්ලති

**43.** ව්‍යාකරණානුකූලව **දෝෂ සහිත** වාක්‍යය කුමක් ද?
(1) සො චතුහි මාසෙහි එකං ගාථං ගණ්හිතුං නාසක්ඛි.
(2) සා රඤ්ඤො පියා අහොසි.
(3) භික්ඛූ භගවන්තං යාචිංසු.
(4) එකා දාරිකා අය්‍යකාය සද්ධිං අවසෙසා අහොසි.
(5) සත්ථාරා චත්තාරො පුග්ගලො කථිතා.

**44.** '**භගවා භික්ඛූනං ධම්මං දෙසෙසි**' යන්නෙහි නිවැරදි කර්මකාරක වාක්‍යය තෝරන්න.
(1) භගවතා භික්ඛූනං ධම්මො දෙසිතො.
(2) භගවා භික්ඛූනං ධම්මෙන දෙසිතො.
(3) භගවන්තෙන භික්ඛූනං ධම්මං දෙසිතං.
(4) භගවතා භික්ඛූනං ධම්මො දෙසීයති.
(5) භගවන්තෙන භික්ඛුං ධම්මං දෙසෙසි.

**45.** දුටුගැමුණු රජතුමාට මිරිසවැටිය සාදා නිම කිරීමට ගත වූ කාලය
(1) මාස හතකි.
(2) මාස නවයකි.
(3) වර්ෂ තුනකි.
(4) වර්ෂ හතරක් සහ මාස තුනකි.
(5) වර්ෂ පහකි.

**46.** කාව්‍යාත්මක ප්‍රයෝග සහිත ගාථා පාදය තෝරන්න.
(1) ගම්භීරපඤ්ඤෙන සුදෙසිතානි
(2) එතෙන සච්චෙන සුවත්ථි හොතු
(3) සබ්බෙව භූතා සුමනා භවන්තු
(4) ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
(5) වරො වරඤ්ඤූ වරදො වරාහරො

**47.** රතන සූත්‍රයෙහි ඇතුළත් ගාථා සංඛ්‍යාව
(1) පහළොවකි. (2) දහසයකි. (3) දාහතකි. (4) දහඅටකි. (5) දහනවයකි.

**48.** '**මාලුවා සාලමිවොතතං**' යන්නෙහි තේරුම දැක්වෙන වාක්‍යය තෝරන්න.
(1) මල් වැලක් එතුණු සල් ගසක් මෙනි.
(2) සල් ගසක එතුණු මාලුවා වැලක් මෙනි.
(3) මාලුවෙකු ශාලාවක තැබුවාක් මෙනි.
(4) සල් ගසක් වැටුණු කැළයක් මෙනි.
(5) දැළකට හසුවුණු මාළුවෙකු මෙනි.

**49.** බුදුරදුන් කොසොල් වැසියකු බව සඳහන් සූත්‍ර දේශනාවක් වන්නේ
(1) ධම්මචෙතිය සූත්‍රයයි.
(2) මහාපරිනිබ්බාන සූත්‍රයයි.
(3) මහාසීහනාද සූත්‍රයයි.
(4) සතිපට්ඨාන සූත්‍රයයි.
(5) සංගීති සූත්‍රයයි.

**50.** පහත සඳහන් ඒවායින් **වැරදි** ප්‍රකාශය තෝරන්න.
(1) බයිබලය මුලින් ම ලියා ඇත්තේ හීබ්‍රෑ භාෂාවෙනි.
(2) මුලින් ම වේද ග්‍රන්ථ ලියා ඇත්තේ වෛදික භාෂාවෙනි.
(3) ජෛන ආගමික ග්‍රන්ථ මුලින් ම ලියා ඇත්තේ අර්ධ මාගධී භාෂාවෙනි.
(4) බුදුගොස් හිමියන්ට අනුව බුදුරදුන් ධර්මය දේශනා කළේ මාගධී භාෂාවෙනි.
(5) මුලින් ම කුරාණය ලියා ඇත්තේ රෝමන් භාෂාවෙනි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| පාලි II<br>பாளி II<br>Pali II | 74 S-T-E II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

* I කොටසේ **සියලු ම** ප්‍රශ්නවලට ද II හා III කොටස්වලින් ප්‍රශ්න **තුනක් ද** තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු, සම්පූර්ණයෙන් **එක් භාෂාවකින්** පමණක් සැපයිය යුතු ය.

## I කොටස

**1.** **සිංහලට** නගන්න.

(i) සත්ථා දිස්වා එවමාහ. "භික්ඛවෙ, තුම්හෙ එතං භික්ඛුං අනිච්ඡමානං ආදාය ආගතා, කිං කතං ඉමිනා"ති. "භන්තෙ, අයං භික්ඛු එවරූපෙ නීය්‍යානිකෙ සාසනෙ පබ්බජිත්වා සමණධම්මං කරොන්තො විරියං ඔස්සජිත්වා ආගතො"ති. අථ නං සත්ථා ආහ. "සච්චං කිර තයා භික්ඛු විරියං ඔස්සට්ඨන්"ති. සච්චං භගවාති. "කිං පන ත්වං භික්ඛු, එවරූපෙ සාසනෙ පබ්බජිත්වා අප්පිච්ඡොති වා සන්තුට්ඨොති වා පවිවිත්තොති වා ආරද්ධවිරියොති වා එවං අත්තානං අජානාපෙත්වා ඔස්සට්ඨවිරියො භික්ඛූති ජානාපෙසි, නනු ත්වං පුබ්බෙ විරියවා අහොසි? තයා එකෙන කතං විරියං නිස්සාය මරුකන්තාරෙ පඤ්චසු සකටසතෙසු මනුස්සා ච ගොණා ච පානීයං ලභිත්වා සුඛිතා ජාතා, ඉදානි කස්මා විරියං ඔස්සජසීති? සො භික්ඛු එත්තකෙන උපත්ථම්භිතො අහොසි.

(ලකුණු 10 යි.)

(ii) ථෙරපුත්තාභයො යොධො, දීය්‍යමානං න ඉච්ඡි තං,
පුච්ඡිතො'ව කිමත්ථන්ති, යුද්ධමත්ථී'ති අබ්‍රවි.

එකරජ්ජෙ කතෙ යුද්ධං, කින්නාමත්ථී'ති පුච්ඡිතො,
යුද්ධං කිලෙසචොරෙහි, කරිස්සාමි සුදුජ්ජයං.

ඉච්චෙවමාහ තං රාජා, පුනප්පුනං නිසෙධයි,
පුනප්පුනං සො යාචිත්වා, රඤ්ඤො'නුඤ්ඤාය පබ්බජි.

පබ්බජිත්වා ච කාලෙන, අරහත්තමපාපුණි,
පඤ්චඛීණාසවසත, පරිවාරො අහොසි ච. (ලකුණු 10 යි.)

**2.** (i) **සිංහලට** නගන්න.

චූල්ලපන්ථකො බුද්ධසාසනෙ සිනෙහෙන ගිහිභාවං න පත්ථෙති. තස්මිං ච කාලෙ මහාපන්ථකො භත්තුද්දෙසකො හොති. ජීවකො කොමාරභච්චො බහුං ගන්ධමාලං ආදාය අත්තනො අම්බවනං ගන්ත්වා සත්ථාරං පූජෙත්වා ධම්මං සුත්වා උට්ඨායාසනා දසබලං වන්දිත්වා මහාපන්ථකං උපසංකමිත්වා කිත්තකා භන්තෙ සත්ථු සන්තිකෙ භික්ඛූති පුච්ඡි. පඤ්චමත්තානි භික්ඛුසතානීති. ස්වෙ භන්තෙ බුද්ධපමුඛානි පඤ්චභික්ඛුසතානි ආදාය අම්හාකං නිවෙසනෙ භික්ඛං ගණ්හථාති. උපාසක, චූල්ලපන්ථකො නාම දන්ධො භික්ඛු අවිරූළ්හිධම්මො, තං ඨපෙත්වා සෙසානං නිමන්තණං පටිච්ඡාමීති ථෙරො ආහ. තං සුත්වා චූල්ලපන්ථකො චින්තෙසි. ථෙරො එත්තකානං භික්ඛූනං නිමන්තණං පටිච්ඡන්තො මං බාහිරං කත්වා පටිච්ඡති, නිස්සංසයං මය්හං භාතිකස්ස මයි චිත්තං භින්නං භවිස්සති, කිං දානි මය්හං ඉමිනා සාසනෙන? ගිහී හුත්වා දානාදීනි පුඤ්ඤානි කරොන්තො ජීවිස්සාමීති.

(ලකුණු 10 යි.)

[ අනෙක් පිටුව බලන්න/மறுபக்கம் பார்க்க/Please turn over

A/L පන්තිය
www.alpanthiya.lk

(ii) **පාලියට** නගන්න.

(අ) මම භික්ෂූන්ට ආහාර පිදුවෙමි.

(ආ) අපි දිවයිනක වාසය කරමු.

(ඉ) මෙහි ළමයි ඉගෙන ගන්නාහුය.

(ඊ) සොරු ගමෙහි ගොනුන් සොරකම් කරති.

(උ) තෙපි බුදුරදුන්ගේ ධර්මය අසවු.

(ලකුණු 10 යි.)

## II කොටස

**3.** (i) පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි සහ රීස් ඩේවිඩ්ස් පඬිතුමා යන දෙදෙනා විසින් සම්පාදිත කෘති **එක** බැගින් නම් කරන්න.

(ii) "අනුජානාමි භික්ඛවෙ සකාය නිරුත්තියා බුද්ධවචනං පරියාපුණිතුං" යන ප්‍රකාශය කවුරුන් විසින් කුමක් නිසා කරන ලද්දක් දැයි පෙන්වා දෙන්න.

(iii) පාලි භාෂාවෙහි ප්‍රභවය සම්බන්ධයෙන් බුදුඝොස් හිමියන් දක්වන අදහස පැහැදිලි කරන්න.

(iv) බැමිණිතියාසාය සමයෙහි ත්‍රිපිටකය රැක ගැනීම උදෙසා ශ්‍රී ලාංකික යතිවරුන් දැක්වූ කැපවීම කෙටියෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 2 + 4 + 6 + 8 = 20 යි.)

**4.** (i) "යස්ස මූලෙ නිසින්නො'ව, සබ්බාරිවිජයං අකා..." යනාදී ගාථාව ඇතුළත් ග්‍රන්ථය නම් කරන්න.

(ii) විනය ඛන්ධකවල ඇතුළත් මහාඛන්ධකය සහ භික්ඛුනීක්ඛන්ධකය කෙටියෙන් හඳුන්වන්න.

(iii) අවම වශයෙන් ග්‍රන්ථ **තුන** බැගින් නම් කරමින්, ථේරවාද හා සර්වාස්තිවාදී අභිධර්ම පිටක හඳුන්වන්න.

(iv) දාඨාවංසයේ කර්තෘ, කාලය හා අන්තර්ගතය පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ලකුණු 2 + 4 + 6 + 8 = 20 යි.)

## III කොටස

**5.** (i) පහත දී ඇති පදවල **විභක්තිය** දක්වන්න.

(අ) තස්මා (ආ) පජාය (ඉ) යාති
(ඊ) රත්තො (උ) චිත්තා (ඌ) තථාගතෙන
(එ) සක්‍යමුනී (ඒ) තුම්හෙසු (ඔ) ගච්ඡතො
(ඕ) රඤ්ඤා

(ii) පහත දැක්වෙන ක්‍රියාපදවල **අතීත රූපය** දක්වන්න.

(අ) ගච්ඡාමි (ආ) කරොන්ති (ඉ) ලභති
(ඊ) දෙසෙන්ති (උ) තිට්ඨන්ති (ඌ) හොති
(එ) පමුච්චති (ඒ) දදාමි (ඔ) සංවිදහති
(ඕ) නිපජ්ජන්ති

(iii) වරහන් තුළ දී ඇති පද යොදා හිස්තැන් පුරවන්න.

(අයං, ඉදං, නං, සදෙවකස්ස, සො)

(අ) අථ සත්ථා ............................ පුරිසං ආහ.

(ආ) භගවා පවුත්තො ............................ ධම්මො නිපුණො සුඛො ච හොති.

(ඉ) තාත, කිං කත්වා ............................ ධනං ලද්ධන්ති පුච්ඡි.

(ඊ) තුවං ............................ ලොකස්ස ගතිං පජානාසි.

(උ) ............................ භික්ඛු බහුං බුද්ධවචනං උග්ගණ්හි.

www.alpanthiya.lk

(iv) පහත වගුවේ **A** තීරුවේ දැක්වෙන සූත්‍ර අයත් වන ග්‍රන්ථය **B** තීරුවෙන් තෝරාගෙන ගළපා ලියන්න.

| | A | B |
|---|---|---|
| අ | අග්ගඤ්ඤ සූත්‍රය | දීඝනිකාය |
| ආ | කෙසපුත්තියකාලාම සූත්‍රය | මජ්ඣිමනිකාය |
| ඉ | චූල්ලහත්ථිපදොපම සූත්‍රය | සංයුත්තනිකාය |
| ඊ | ධජග්ග සූත්‍රය | අංගුත්තරනිකාය |
| උ | ධම්මික සූත්‍රය | සුත්තනිපාත |

(ලකුණු 5 + 5 + 5 + 5 = 20 යි)

6. (i) "**සහාවස්ස දස්සනසම්පදාය - තයස්සු ධම්මා ජහිතා භවන්ති**" යන්නෙහි ධර්මානුකූල අදහස කෙටියෙන් දක්වන්න.

(ii) ධම්මපදයේ අත්ත වර්ගයෙන් ජීවිතයට ලබා දෙන උපදේශ **තුනක්** අදාළ ගාථා පාඨ සහිතව පැහැදිලි කරන්න.

(iii) බෝධිසත්ත්ව චරිතයේ විශේෂ ලක්ෂණ **පහක්** අදාළ ජාතක කථා ඇසුරෙන් පෙන්වා දෙන්න.

(iv) ආගම වෙනුවෙන් පැරණි ශ්‍රී ලාංකිකයන්ගේ කැපවීම කෙබඳු දැයි මහාවංසයේ මිරිසවැටි විහාර පූජෝත්සව විස්තරය ඇසුරෙන් පෙන්වා දෙන්න.

(ලකුණු 5 + 5 + 5 + 5 = 20 යි)